කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව
ශාස්ත්‍ර පීඨය

**ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය- 2017/18**
**SOC 2217 - නාගරික සහ ප්‍රජා අධ්‍යයනයට හැඳින්වීමක්**
**පැ දෙක (02) යි**

**ඕනෑම ප්‍රශ්න තුන(03)කට පිළිතුරු සපයන්න.**

---

1. ඓතිහාසිකව නගරය භාජන වී ඇති පරිණාමීය ක්‍රියාවලිය දෙස බලන කල, නගරය මේ වන විට ගෝලීය ප්‍රජාවක් බවට පත්ව ඇතැයි යන අදහසට ඔබ එකඟ වනවාද? ඔබගේ පිළිතුර පහදන්න.

2. නගරයට කිසිදා ප්‍රජාවක් බවට පත් විය නොහැකි බව ලුවී වර්ත් විශ්වාස කළේය. මෙම විශ්වාසය ඔබ පහදන්නේ කෙසේද?

3. නගරය පිළිබඳ මිථ්‍යා තුනක් පිළිබඳව Boschetti ඇතුළු පිරිස (2017) සාකච්ඡා කළහ. නාගරික ජීවිතයට ඇති ඉල්ලුම සැමදා වර්ධනය වන සන්දර්භයක් තුළ ඔබ මෙම මිථ්‍යා තුන ඔබ අර්ථකථනය කරන්නේ කෙසේද?

4. *Migrants on the Margins* යන චිත්‍ර කතා පොත අත්‍යවශ්‍යයෙන්ම තිරසාර නාගරික අසල්වැසි සමූහ නොවන, ආන්තීකරණයට ලක් වූ ප්‍රජාවන්ගේ නාගරික ජීවිතය පිළිබඳව නිරූපණයකි. එම කෘතිය තුළ විස්තර කෙරෙන එක් ප්‍රජාවක්වත් ඇසුරු කර ගනිමින් තිරසාර නාගරික අසල්වැසි සමූහයක ලාක්ෂණික විචාරාත්මකව සාකච්ඡා කරන්න.

5. නැවත පදිංචි කරවන ලද නාගරික ප්‍රජාවන් තුළ තිරසාර අසල්වැසි සමූහ බිහි කිරීමෙහි ලා ශ්‍රී ලංකා රජය මුහුණ දෙන අභියෝග මොනවාද? සාකච්ඡා කරන්න.

6. තමා නාගරික අසල්වැසි කණ්ඩායමකට අයත් බව බොහෝ නාගරිකයින්ගේ විශ්වාසයයි. මෙම අයත්බව පිළිබඳ හැඟීම ඇති වීමෙහි ලා නේවාසික සමූහ ගතකිරීම (residential segregation) උපකාරී වන්නේද? විචාරාත්මකව සාකච්ඡා කරන්න.

**************************